# මාධ්‍ය නිවේදනය

**අ.පො.ස. (උ/පෙළ) විභාගය - 2021 (2022)**
**ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා අයදුම්පත්‍ර කැඳවීම**

1. **උක්ත විභාගයේ නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට පමණක් කැඳවනු ලැබේ.**
2. **අයදුම්පත් භාරගැනීම 2022.09.15 දින සිට 2022.09.28 දක්වා සිදුකරනු ලැබේ.**
3. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට පහත දැක්වෙන ක්‍රමයක් අනුගමනය කරන්න.

   ❖ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://www.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති මාර්ගගත අයදුම්පත් "පාසල් විභාග" මත Click කිරීම මගින්.

   ❖ විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදුම (Mobile Application) වන DoE වෙත පිවිස මාර්ගගත අයදුම්පත් (පාසල් විභාග) මත Click කිරීම මගින්.

   ❖ https://onlineexams.gov.lk/eic වෙත පිවිසීම මගින්.

4. **පද්ධතියට පිවිසීමේ දී ඔබ අ.පො.ස. (උ/පෙළ) - 2021 (2022) විභාගයට පෙනී සිටි විභාග අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකයම භාවිත කිරීමට සැලකිලිමත් විය යුතුය.**
5. අයදුම්පත් සම්පූර්ණ කිරීමට ප්‍රථම Technical Instructions, Common Instructions සහ උපදෙස් පිළිවෙළින් කියවීම, නිවැරදි ආකාරයට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.
6. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 250/- කි. Credit කාඩ් / Debit කාඩ් මගින් හෝ තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදුකළ හැකි ය.
7. මුදල් ගෙවීමෙන් පසු අයදුම්පත්‍රය PDF ක්‍රමයට බාගත(Download) කරගත හැකි අතර, එම අයදුම්පත්‍රය ඔබ භාරයේ තබාගත යුතු ය. එසේම මුදල් ගෙවීමෙන් පසු ඔබගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් ද ලැබෙනු ඇත.
8. නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය සියලුම විෂයයන් සහිතව නිවැරදිව අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. අදාළ ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
9. විෂය අංක (12) - සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30 කට වඩා අඩුවීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එම විෂයය සඳහා ද නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.
10. මේ සම්බන්ධයෙන් කිසියම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන දුරකථන අංක මගින් විමසීම් කළ හැකි ය.

| | | |
|---|---|---|
| **පාසල් විභාග (ඇගයීම්) ශාඛාව** | - | 011-2785231 / 011-2785216 / 011-2784037 |
| **ක්ෂණික ඇමතුම් අංකය** | - | 1911 |

එල්.එම්.ඩී. ධර්මසේන
විභාග කොමසාරිස් ජනරාල්